# 1 බුදුගුණ හැඳින සැදැහැති වෙමු

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘන් වහන්සේ ය. උන්වහන්සේගේ අනන්තවූත් අප්‍රමාණවූත් ගුණ සමුදය සමකාලීන බමුණු පූජකවරුන්ගේ පවා වර්ණනාවට ලක් විය. ඔවුන් බුදුරජාණන් වහන්සේ ගැන එසේ පැහැදීමට හේතු වූ කරුණු රැසක් සූත්‍ර දේශනාවල සඳහන් වෙයි.

බුදුරජාණන් වහන්සේ චම්පා නුවර සමීපයේ ගර්ගරා පොකුණ අසල වාසය කරද්දී, බමුණෝත් ගැහැවියෝත් විශාල පිරිසක් එ දෙසට යන බව **සෝණදණ්ඩ** නම් බ්‍රාහ්මණ තෙමේ දුටුවේ ය. මෙ තරම් විශාල පිරිසක් කොහි යන්නේ දැ යි ඔවුන්ගෙන් විමසූ සෝණදණ්ඩ බමුණාට ඔවුහු තමන් බුදුරජාණන් වහන්සේ දැකීමට යන බව පැවසූහ. මේ ඇසූ සෝණදණ්ඩ බමුණා බමුණු ගැහැවියන් වෙත එළඹ, "භවත්හු (මොහොතක්) බලාපොරොත්තු වෙත් වා. මා ද බුදුරජාණන් වහන්සේ දැකීමට එන බව සැලකරව" යි දැන්වී ය. එදා එම අසපුවට නන් දෙසින් පැමිණ සිටි පන්සියයක් බමුණු පූජකවරුන්ට මෙය මහත් විමතියක් විය. සෝණදණ්ඩ බමුණා එ සේ මෙ සේ කෙනෙක් නො වේ. ඔහු කුලවත්, ධනවත්, වයෝවෘද්ධ, මගධාධිපති **බිම්බිසාර** රජුගේ පවා බුහුමන් ලබා සිටින, රූපයෙනුත් අගතැන්පත්, කලණ වදන් පවසන චම්පා නගරයට අධිපති, තුන්සියයක් මාණවකයනට වේදය උගන්වන ආචාර්යවරයෙකි. ඒ නිසා බමුණෝ " භවත් සෝණදණ්ඩ තෙමේ මහණ ගොයුම්හු දක්නට යනු නොනිසි ය. ශ්‍රමණ ගෞතමයාණන් වහන්සේ ම භවත් සෝණදණ්ඩයන් දක්නට නිසි ය" යි ගමන වළක්වන්නට උත්සාහ කළහ.

ඒ ඇසූ සෝණදණ්ඩයෝ " භවත්නි, ඒ භවත් ගෞතමයාණන් අප දක්නට ඒම නොව, අප ම එතුමා දැකීමට යාම සුදුසු ය." යි බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය මෙ සේ ගෙනහැර දැක්වූහ.

''භවත්නි, මහණ ගොයුම්හු වූ කලී මව්පසින් ද පියපසින් ද යන දෙපසින් මැ අභිජාතය හ, සත්වන මීමුතු යුවල තෙක් පිරිසිදු මවු කුස ඇත්තෝ ය. ජාතිවාදයෙන් නො හෙළන ලද්දෝ ය.''

"භවත්නි. මහණ ගොයුම්හු වූ කලී විශිෂ්ට රූප සම්පත් ඇත්තෝ ය. දැකුම් කටයුතු හ. ප්‍රසාද ජනක ය, උතුම් වර්ණ සෞන්දර්යයෙන් සමන්විත හ. බඹහු සේ උතුම් රන් පැහැ ඇත්තෝ ය. උත්තම ශරීර ප්‍රභා ඇත්තෝ ය. සිය සිරුරෙහි දැක්මට නො මඳ වූ අවකාශ ඇත්තෝ ය."

"භවත්නි, මහණ ගොයුම්හු වූ කලී සිල්වත් හ, පිරිසිදු සිත් ඇත්තෝ ය, නිදෙස් සීලයෙන් සමන්විත ය.''

"භවත්නි, මහණ ගොයුම්හු වූ කලී පහ වූ කාමරාග ඇත්තෝ ය, පහ වූ චපල බව ඇත්තෝ ය."

"භවත්නි, මහණ ගොයුම්හු වූ කලී බොහෝ දෙනාට ආචාර්ය ද ප්‍රාචාර්ය ද වෙති."

"භවත්නි, නොයෙක් දහස් ගණන් දෙවියෝ මහණ ගොයුමන් දිවි හිමියෙන් සරණ ගියහ."

මෙ සේ සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මේ කරුණු සමග තවත් කරුණු දක්වමින් බුදුරජාණන් වහන්සේ දැකීමට තමා ම යාම සුදුසු බව බමුණන්ට පැහැදිලි කර දුන්නේ ය. පහත දැක්වෙනුයේ එම කරුණුවලින් සමහරකි.

| | |
|---|---|
| 01. පරිවාර සම්පත් හැර පැවිදි වීම | 02. ධනය අත් හැරීම |
| 03. රූමත් බව | 04. සිල්වත් බව |
| 05. ශ්‍රේෂ්ඨ ආචාර්යවරයකු බව | 06. කාමාශා දුරු කළ බව |
| 07. දෙව්බඹුන් පවා උන්වහන්සේ සරණ ගිය බව | |

කොසොල් රටේ **ඕපසාද** ගමේ **චංකී** බ්‍රාහ්මණයා ද සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මෙන් ම, ධනවත්, රූමත්, උගත්, වෘද්ධ, කුලවත්, සිල්වත්, ත්‍රිවේද පාරප්‍රාප්ත ආචාර්යවරයෙකි. බුදුරජාණන් වහන්සේ ඕපසාද ගමට උතුරින් පිහිටි දේවවන සල්වනයෙහි වැඩ සිටින බව දැනගත් ඕපසාද වැසියෝ බුදුරජාණන් වහන්සේගේ ගුණයත්, කීර්තියත් අසා දේවවන සල්වනය දෙසට ගියහ. "මෙ තරම් විශාල ජනකායක් කොහි යන්නේ ද" යි චංකී බ්‍රාහ්මණයා **ඛත්ති** මහ ඇමතිවරයාගෙන් ඇසුවේ ය. ඔවුන් බුදුරජාණන් වහන්සේ දැකීමට යන බව ඇමතිවරයාගෙන් දැනගත් චංකී බමුණාට ද බුදුරදුන් දැකීමට යාමේ සිතක් පහළ විය. එ ද නන් දෙසින් පැමිණි බමුණෝ පන්සියයක් අසපුවේ සිටියහ. චංකී බමුණු පූජකවරයා ද බුදුරදුන් දැකීමට යන බව ඔවුනට අසන්නට ලැබිණ. ඒ බමුණෝ ඔබ වැනි උගත්, වෘද්ධ, ධනවත්, සිල්වත්, කොසොල් රජුගෙන් පවා ගරු බුහුමන් ලබන ත්‍රිවේද පාරප්‍රාප්ත ආචාර්යවරයකු බුදුරදුන් දැකීමට නො යා යුතු බවත්, බුදුරදුන් ඔබතුමා හමු වීමට පැමිණිය යුතු බවත් කියමින් ගමන වළක්වන්නට උත්සාහ

කළහ. චංකී බ්‍රාහ්මණයා තමා බුදුරදුන් වෙත යන හේතු පැවසී ය.

භවත් ගෞතමයන් වහන්සේ කුලවත්, ධනවත්, රූමත්, වෘද්ධ, කාමාශා දුරු කළ විශාල පිරිසකගේ ආචාර්යවරයෙකි. එතුමා දෙව් බඹුන්ට පවා දහම් දෙසන **කොසොල්** රජුගේ ගෞරවාදරයට පාත්‍ර වූ කෙනකු බවත් ඒ නිසා අප උන්වහන්සේ දැකීමට යා යුතු බවත් හෙතෙම පහදා දුන්නේ ය.

එ ලෙස චංකී බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේ ගැන පළ කළ අදහස් ද සෝණදණ්ඩ බ්‍රාහ්මණයාගේ අදහස්වලට සමාන බව පෙනේ.

බුදුරජාණන් වහන්සේ ඇතැම් පිරිවැජියන්ගේ ආශ්‍රමවලට වඩින අවස්ථාවල දී ප්‍රධාන පිරිවැජියෝ තම පිරිස නිශ්ශබ්ද කරවීමෙන් උන්වහන්සේට ගෞරව දැක්වූහ. දිනක් සැවැත් නුවරට වැඩි බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා වැඩීමට එළඹෙන තෙක් **ඒකසාලක** නම් **මල්ලිකා** දේවියගේ උයනෙහි පිරිවැජියන් තුන්දහසක් සමග සිටි **"පොට්ඨපාද"** නම් පිරිවැජියාගේ ආරාමය වෙත වඩිමින් සිටියහ. පොට්ඨපාද පිරිවැජියා ඈතින් වඩිනා බුදුරජාණන් වහන්සේ දැක විවිධ කථා කියමින් ඉතා උස් හඬින් ඝෝෂා කරමින් සිටි පිරිවැජි පිරිස නිහඬ කරවූයේ මෙ සේ ය.

''භවත්හු නිහඬ වෙත් වා. මේ මහණ ගොයුම් එයි. ඒ ආයුෂ්මත් තෙම නිහඬ බව කැමැත්තේ ය. නිහඬ බවෙහි ගුණ කියන සුලු ය. පිරිස නිහඬ සේ දැන එළැඹිය යුතු කොට සිතුවොත් යෙහෙකැ''

මෙසේ බුදුරජාණන් වහන්සේ වඩින බවත් උන්වහන්සේ නිශ්ශබ්දතාවට කැමැති බවත් නිශ්ශබ්දතාවේ ගුණ කියන බවත් කියමින් පිරිස නිශ්ශබ්ද කරවී ය. බුදුරජාණන් වහන්සේ පරිබ්‍රාජක ආරාමයට වැඩි සේක. උන්වහන්සේගේ පැමිණීම නිසා පොට්ඨපාද පිරිවැජියාට මහත් සතුටක් ඇති විය. පිරිවැජියා, බුදුරජාණන් වහන්සේට පිළියෙල කරන ලද ආසනය පෙන්වූයේ ය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වඩිනා සේක් වා, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩමවීම ඉතා යහපත් ය. භාග්‍යවතුන් වහන්සේ කලෙකට පසු මෙහි වැඩි සේක. ඔබ වහන්සේට මෙහි ආසනයක් ද පනවා තිබේ".

බුදුරජාණන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වූ වේළුවන විහාරයෙහි වැඩ වසන සමයෙහි, මෝරනිවාප නම් පරිබ්‍රාජක අසපුවෙහි පිරිවැජියන් විශාල පිරිසක් සමග සිටි සකුලුදායී පිරිවැජියා ද උන් වහන්සේ තම අසපුවට එනු දැක, මහත් ප්‍රීතියට පත්විය. බුදුරජාණන් වහන්සේ පිළිගත් පිරිවැජියා මෙසේ සතුට පළ කළේ ය.

''ඔබ වහන්සේ මෙහි වැඩම කළේ කලෙකට පසුව යි. වැඩම වීම බොහො ම හොඳයි. පැනවූ ආසනය තිබේ. වැඩ හිඳිනු මැනවි.''

වරෙක **නිගණ්ඨනාතපුත්ත** ශාස්තෘතුමන් විසින් බිම්බිසාර රජුගේ පුත් **අභය** රාජ කුමාරයා බුදුරජාණන් වහන්සේ හා වාද කිරීම සඳහා යවන ලද්දේ මෙ සේ කියමිනි.

''රාජ කුමාරය, තෙපි ශ්‍රමණ ගෞතමයන්හට වාදාරෝපණය කරව, අභය රජ කුමරක්හු විසින් මෙ සේ මහත් සෘද්ධි ඇති මෙසේ මහත් ආනුභාව ඇති ශ්‍රමණ ගෞතමයන්හට වාදාරෝපණය කරන ලදැ යි මෙසේ තොපගේ කල්‍යාණ වූ යස ගොස් උස් ව නැගේ.''


ඇසිය යුතු ප්‍රශ්න පිළිබඳ ව දැන ගත් අභය රාජකුමාරයා **වේළුවනාරාමයට** ගිය නමුත්, එදා වාද නො කොට, පසුව ද දනට ආරාධනා කොට ගියේ ය. පසුව ද දන් වළඳවා අවසානයෙහි මිටි ආසනයක හිඳගත් අභය රාජ කුමාරයා තම ප්‍රශ්න ඉදිරිපත් කළේය. බුදුරජාණන් වහන්සේ ඔහුගේ ප්‍රශ්නවලට මැනවින් පිළිතුරු දුන් සේක. මෙයින් පැහැදුණු අභය රාජ කුමාරයා "ස්වාමීනි, ඔබ වහන්සේ අන්‍යයන් අසන ප්‍රශ්නවලට පිළිතුරු කල් තියා සූදානම් කර ගෙන සිටින සේක් ද " යි විමසීමෙන් ම කුමාරයා බුදුරදුන් පිළිබඳ ව කළ ඇගයුම පැහැදිලි ය. බුදුරදුන් සමඟ වාදයකට ගිය **උපාලි** ගෘහපතියා බණ අසා පැහැදී :

> " ස්වාමීනි, මම පළමු උපමාවෙන් ම භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීමෙහි සතුටු සිත් ඇතියෙම් ප්‍රසන්න වීමි. එතකුදු වුවත් මම, භාග්‍යවතුන් වහන්සේගේ විසිතුරු ප්‍රශ්න විසඳීම් තව දුරටත් අසනු කැමැත්තෙම් මෙ සේ මම භාග්‍යවතුන් වහන්සේට විරුද්ධ ව බස් කිව යුතුයැ යි සිතීමි ස්වාමීනි, ඉතා මැනැවැ ස්වාමීනි, ඉතා මැනැවැ වහන්ස, ...... මම බුදුන් සරණ කොට යෙමි. දහම් සරණ කොට යෙමි. සංඝයා ද සරණ කොට යෙමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් මා දිවිහිමි වැ සරණ ගිය උපාසකයකු කොට දරන සේක්වා" යි ප්‍රකාශ කළේ ය.

මෙහි දී බුදුරදුන් උපාලි ගෘහපතියාට වදාළේ ඉක්මන් තීරණ නො ගෙන ක්‍රියා කිරීම ඔහු වැනි ප්‍රසිද්ධ පුද්ගලයන්ට වඩාත් සුදුසු වන බව ය. එ විට උපාලි "ස්වාමීනි, මා වැනියකු වෙනත් සමයක් මෙ සේ වැළඳ ගත්තේ නම් ඔවුන් කොඩි දමා මා පිළිගනු ඇත. ඔබ වහන්සේ තව දුරටත් සිතා බලා කටයුතු කරන්නැ යි මා හට අනුශාසනා කිරීම ගැන මම පුදුම වෙමි." යි පවසමින් දෙවනු ව ද තෙරුවන් සරණ ගියේ ය.

ඉන් පසු බුදුරජාණන් වහන්සේ, උපාලි ගෘහපතියාට, "ගැහැවිය, තොපගේ ගෙය බොහෝ දවසක් නුවටුනට පැන් පොකුණක් මෙන් සිටියේ ය. එ හෙයින් එළඹියා වූ ඔවුනට පිණ්ඩපාතය දිය යුතු කොට සිතව" යි පැවසූහ.

" ස්වාමීනි, මෙ තෙක් කල් මා අසා තිබුණේ ඔබ වහන්සේ ඔබ වහන්සේට ම, ඔබ වහන්සේගේ ශ්‍රාවකයන්ට ම දන් දීමට අනුශාසනා කරනබව යි. එහෙත් දූන් ඔබ වහන්සේ මා පෙර ජෛන පූජකයන්ට දුන් දන් එ සේ ම දෙන්නැ යි වදරති. එයින් මම තවදුරටත් පැහැදුනෙමි " යි. පැවසූ හෙතෙම තෙවනුව ද තෙරුවන් සරණ ගියේ ය. උපාලිගේ මේ ප්‍රකාශ තුළ ඇත්තේ බුදුරදුන් පිළිබඳ ඇගයීමකි.



සමකාලීනයන් පමණක් නොව පසුකාලීන වියත්හු ද බුදුරජාණන් වහන්සේ උසස් ලෙස ඇගයුමට ලක් කළහ.

**මන්මථනාත් ශාස්ත්‍රී** නැමැති ඉන්දියානු පඬිවරයා පවසන්නේ බුදුරජාණන් වහන්සේ නව මානව වංශයක් පහළ කළබව යි.

ප්‍රථම ඉන්දියානු අගමැති **ජවහර්ලාල් නේරුතුමා** "බුදුරජාණන් වහන්සේගේ සනාතන දහම් පණිවුඩය දීප්තිමත් තරුවක් සේ බබළයි. නිවැරැදි ව සිතීමට හා ක්‍රියා කිරීමට හැකි පමණින් දිරිමත් ව කටයුතු කරමු" යයි පැවැසී ය.

"බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්ය සත්‍යයේ හා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අන්තර්ගත අලංකාරවත් සාරගර්භ කරුණු අභිබවා යන වෙනත් කිසි ම ආගමික ඉගැන්වීමක් නැතැ " යි. පැවසුවේ ප්‍රකට යුරෝපීය විද්වතකු වූ **රීස් ඩේවිඩ්ස්** පඬිතුමා ය.

ආචාර්ය **සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණන්** පැවැසුවේ කවර අවස්ථාවක දී වත් බුදුරජාණන් වහන්සේට කෝපය හෝ තරහව ඇති නො වූබවත් උන් වහන්සේගේ මුවින් කිසි විටෙකත් අකාරුණික වචන නො ගිලිහුණුබවත් ය.

ලෝක ප්‍රසිද්ධ ඉතිහාසඥ හා ලේඛක **එච්. ජී. වේල්ස්** පැවැසුවේ "ප්‍රඥ ලොවක් කරා තනි ව සන්නද්ධ ව සරල දිවිමගක පිය නගන බැතිබර හා ප්‍රභාස්වර පෞරුෂයකින් පිරිපුන් නියම මිනිසකු මම දකිමි. අද්භූත මිථ්‍යා කථා රැසක් අතුරින් මතුව පෙනෙන එතුමාණන් සැබෑ මිනිසකු බැව් වැටහෙයි. ජීවිතයේ සියලු දුක් දොම්නස් හා අතෘප්තිකරභාවයන් ආත්මාර්ථකාමීත්වය නිසා ම හට ගැනෙන බැව් උන්වහන්සේ වදළහ." යනුවෙනි.

මුස්ලිම් පඬිවරයකු වූ **අබ්දුල් අතාහිලා** "මිනිස් වර්ගයා අතර පහළ වූ අතිශ්‍රේෂ්ඨ පුරුෂෝත්තමයාණන් බුදුරජාණන් වහන්සේ ය" යනුවෙන් පැවසී ය.

"මිනිස් වර්ගයා අතුරින් උපරිම සංඛ්‍යාවකගේ පූජෝපහාර ලද එක ම පුරුෂෝත්තමයා බුදුරජාණන් වහන්සේ ය "යි අගය කළේ මහාචාර්ය සෝන්ඩර්ස් ය.

"ආසියාවේ ආලෝකය" නැමැති ග්‍රන්ථයේ දී ශ්‍රීමත් **එඩ්වින් අර්නෝල්ඩ්** මහතා පවසා ඇත්තේ, "මිනිස් පරපුර නැමැති වෘක්ෂයේ අපමණ කලෙකට පසු ව පිපෙන, පිපුනාට පසු ව ප්‍රඥ සුගන්ධයෙන් සහ කරුණා මකරන්දයෙන් ලෝකය පුරවන අසාමාන්‍ය පුෂ්පය බුදුරජාණන් වහන්සේ ය " කියා යි.

මෙ සේ පෙරදිග අපරදිග විවිධ වියත්හු බුදුරජාණන් වහන්සේගේ අසමසම නිදහස් චින්තනය, ගුණ මහිමය හා ශ්‍රේෂ්ඨත්වය නොයෙක් අයුරින් ඇගයුමට ලක් කළහ.

# සාරාංශය

කරුණාවේ හා ප්‍රඥාවේ අසමසම මූර්තිය වූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පෙර අපර දෙදිග ම ඈත කාලයේ මෙන් ම මෑත කාලයේ ද විසූ බෞද්ධ අබෞද්ධ පූජ්‍ය පූජක උතුමන්ගේ විද්වතුන්ගේ මෙන් ම ජන නායකයන්ගේ ද අපමණ ගෞරවාදරයටත් ඇගයීමටත් ලක් වූ ශාස්තෘවරයෙකි. බුදුරදුන් දවස විසූ සෝණදණ්ඩ, චංකී, සකුලුදායී ආදී සුප්‍රකට ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද, උපාලි, අභයරාජ කුමාර වැනි ගිහි ජන ප්‍රධානීන් හා විද්වත්හු ද උන්වහන්සේගේ ගුණ මහිමය අගය කළහ. එසේ ම පසුකාලීන ව ලොව විසූ කීර්තිමත් ගිහි උතුමන් වන ජවහර්ලාල් නේරු, සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණන්, එච්.ජී. වේල්ස් වැන්නෝ ද උන්වහන්සේගේ චරිතය හදුරා ඒ උතුම් ගුණානුවණ ඇගයුමට ලක් කළහ. බෞද්ධ දරුවන් වන අප ද බුදුගුණ බුදුනුවණ දැන දැක ශ්‍රද්ධාව උපදවා ගත යුතු ය. බුද්ධානුස්සතිය වැඩි දියුණු කළ යුතු ය.

## ක්‍රියාකාරකම්

01. බුදුරජාණන් වහන්සේ සියලු ම ආගම් ශාස්තෘවරුනට වඩා උතුම් ගුණනුවණින් යුක්තයහ යි පිළිගැනීමට ඔබ දක්වන කරුණු පහක් ලියන්න.

02. පහත සඳහන් අයුරු වගුවක් සකස් කරන්න.

| බුදුරදුන් පිළිබඳ සමකාලීන ඇගයීම් | බුදුරදුන් පිළිබඳ නූතන ඇගයීම් |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |

## පැවරුම

ජයමංගල ගාථාවන්හි එන බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය සැකෙවින් පැහැදිලි කරමින් විද්‍යාලයීය බෞද්ධ ශිෂ්‍ය සංගමය අමතා කථාවක් පැවැත්වීමට පිටපතක් පිළියෙල කරන්න.

## පුහුණුවට

| | |
|---|---|
| අපමණ කලක් තුළ එක වරෙක දි | පිපෙන |
| මනු පරපුර නමැති තුරු මුදුනත | දිලෙන |
| මහ පැන සුවඳ මහ කරුණා පැණි | පිරුණ |
| මුළු ලොව අසිරිමත් කුසුම ය බුදු | රුවන |